
මොකාද



මේ කුරුල්ලා?

වි. සුතේයෙව්


වි. සුතේයෙව්

මොකාද



මේ කුරුල්ලා?

අනුවාදය
පද්ම හර්ෂ කුරණාගේ



ඔන්න එකෝමත් එක රටක පාත්තයෙක් හිටියා. මේ පාත්තයා හරිම මෝඩයි, ඉරිසියයි.


හැම කෙනාටම ඉරිසියා කරනවා. හැම කෙනා එක්කම රණ්ඩු කරගන්නවා. හැම කෙනාටම කොටනවා. ඉතින් ඔක්කෝම කියනවා “අපෝ, මෙහෙම පාත්තයෙක්!” කියල.



දවසක් පාත්තයා දැක්කා පොකුණේ හංසයෙක් ඉන්නවා. හංසයගෙ දිග බෙල්ලට පාත්තයාට ආසා හිතුණා.

පාත්තයා හංසයට කිව්වා “අපි බෙලි මාරු කර ගනිමු. උඹේ බෙල්ල මට දෙන්න, මගේ බෙල්ල උඹට දෙන්නං” කියලා.

හංසයා ටිකක් වෙලා හිතලා ඒකට කැමති වුණා. ඉතින් දෙන්නා බෙලි මාරු කර ගත්තා.




පාත්තයා හංසයගෙ දිග බෙල්ලත් අරගෙන යනවා. ඒකෙන් මොනව කරන්නද කියල දන්නෙ නෑ. බෙල්ල ඇඹරුවා, කෙළින් කරා, රවුන් කළා. ඒ කොහොම කළත් පහසුවක් නෑ.

කරවැල් කොකෙක් පාත්තයා දැකලා හිනාවෙනවා. "උඹ පාත්තයෙක් නෙවි හංසයෙකුත් නෙවි! හෑ හෑ හා!"

පාත්තයාට බොහොම කේන්ති ගියා. කොටන්න හිතුණා. එතකොටම දැක්කා කරවැල් කොකාගෙ සාක්කුවක් වගේ තියෙන හොට.

"මටත් මේ වගේ හොටක් ඇත්නම්" පාත්තයා මෙහෙම හිතල කරවැල් කොකාට කියනවා.

"අපි හොටවල් මාරු කර ගනිමු. මගෙ රතුපාට හොට උඹට දෙන්නං, උඹේ ඔය සාක්කු හොට මට දීපන්."



කරවැල් කොකා හිනා වුණා. නමුත් ඒකට එකඟ වුණා. ඉතින් දෙන්නා හොටවල් මාරු කර ගත්තා.



මේ මාරු කිරීම් පාත්තයගෙ හිතට බොහොම ඇල්ලුවා.

පාත්තයා මාන කොකා එක්ක කකුල් මාරු කර ගත්තා. තමන්ගෙ දැල් සහිත කකුල් වෙනුවට මාන කොකාගෙ දිග කකුල් ලැබුණා.




තමන්ගෙ සුදු තටු කාක්කාට දීලා, කාක්කගෙ පුංචි කළු තටු ගත්තා.

තමන්ගෙ කොට
වල්ගය දීලා
මොණරගෙ ලස්සන
පිල් ලබා ගන්න
පාත්තයා හුඟ
වේලාවක් පෙරැත්ත
කළා. අන්තිමේ දී
ඒකෙනුත් ජය ගත්තා.



කරුණාවන්ත කුකුළා
තමන්ගෙ කරමලත්,
තැල්ලත්, "කුක්කු කූ"
යන හඬත් පාත්තයාට
තෑගි කෙරුවා.
දැන් පාත්තයා කා
වගේවත් නෙවෙයි.






උඹ කොක් කකුල්වලින් මිදුලෙ ඇවිදිනවා, ඉවක් බවක් නැතුව කපුටු තටුවලින් තටු ගහනවා, හංසයගෙ බෙල්ල එහාට මෙහාට අඹරවනවා.

උඹට පාත්තයෝ රංචුවක් මුණ ගැහුණා.


"ගා - ගා - ගා, මොකාද මේ කුරුල්ලා?" පාත්තයෝ පුදුම වුණා.



“මම පාත්තයෙක්!” පාත්තයා කපුටු තටු ගහලා හංස බෙල්ල කෙළින් කරලා බෙරිහන් දුන්නා. කරවැල් කොකාගෙ සාක්කු හොට හොඳමට ඇරල කුක්කු-කූ කීවා! “මම ඔක්කෝටම වැඩිය හොඳයි!”

“ඉතින් උඹ පාත්තයෙක් නම් යමු අපිත් එක්ක” පාත්තයෝ කීවා.

පාත්තයෝ තණ
පිට්ටනියකට ගියා.
මේ පාත්තයත් උන්
එක්ක ගියා.
ඔක්කොම පාත්තයෝ
තණකොළ කඩනවා.
මේ පාත්තයාට
කරන්න පුළුවන්
ලොකු හොටින්
තණකොළ එහාමෙහා
කරන්න විතරයි.
තණකොළ කඩා
ගන්න බෑ.




පාත්තයෝ පොකුණකට පීනන්න ගියා. මේ පාත්තයත් ගියා උන් එක්ක.

ඔක්කොම පාත්තයෝ පොකුණෙ පීනනවා. මේ පාත්තයා ඉවුරෙ එහා මෙහා දුවනවා. කොක් කකුල් හින්ද පීනන්න බෑ.

පාත්තයෝ "ගා-ගා-ගා!" ගාලා හිනාවෙනවා.


අර පාත්තයා "කුක්කු-කූ!" කියනවා.





පාත්තයෝ ඔක්කොම ඉවුරට ආවා. ඔන්න එතකොට එතන නරියෙක්! පාත්තයෝ කෑගහල ඉගිල්ලිලා ගියා.

මේ පාත්තයා විතරයි ඉතුරු වුණේ. කපුටු තටුවලින් උඹට ඉහළට ඉගිල්ලෙන්න බෑ. කොක් කකුල්වලින් දුවන්න පටන් ගත්තා. මොණර පිල් පැටලුණ හින්ද ඒකත් කරන්න බෑ.....



නරියා දිග හංස
බෙල්ලෙන් පාත්තයාව
ඩැහැ ගත්තා....
මේක දැක්කා
පාත්තයෝ. උන් ඉගිල්ලි
ඉගිල්ලි නරියට හැම
පැත්තෙන්ම කොටන්න
පටන් ගත්තා.
නරියා පාත්තයව අත
ඇරල දිව්වා.



"උඹලට ස්තුතියි, මාව බේරාගත්තා! දැන් මම දන්නවා කරන්න ඕන දේ" පාත්තයා කීවා.

ඉතින් පාත්තයා හංසයා ළඟට ගිහිල්ලා දිග බෙල්ල හංසයට දුන්නා. කරවැල් කොකාට සාක්කු හොට දුන්නා. මාන කොකාට හීන් කකුල් දුන්නා. කාක්කාට කළු තටු දුන්නා. මොණරාට ලස්සන පිල් දුන්නා. කරුණාවන්ත කුකුළාට කරමලයි, තැල්ලයි 'කුක්කු-කූවයි' දුන්නා.



පාත්තයා දැන් පාත්තයා මයි
ඉරිසිය නොකරයි නුවණක්කාරයි
පාත්තයා ගැන කතාව මේකයි
කතන්දරේ අපෙ ඔන්න ඔච්චරයි!

මොකාද මේ කුරුල්ලා ?

කතාව සහ චිත්‍ර
වි. සුතේයෙව්

අනුවාදය
පද්ම හර්ෂ කුරණගේ

නව පරිගණක සකැසුම
මාලක ලලනජීව

ISBN 978-955-1979-10-2

ප්‍රකාශනය

Kanol

කැනොල් පබ්ලිෂිං හවුස්

මුද්‍රණය
රොනැට් එන්ටප්‍රයිසස්

ප්‍රථම මුද්‍රණය 2010



Kanol Publishing House

1196/4, Kottawa Road, Pannipitiya

Tel: 011 4336778, 011 4336779

Kanol

ISBN 978-955-1979-10-2

Rs. 80/-

9''789551''979102''